


**<u>මාගේ වීසාව අයදුම් කර දැන් එය සැකසෙන අවස්ථාවේ (Processing period) පවතීයි.මා හට තාවකාලික A වීසාවක් ( Bridging visa A ) ලැබී තිබේ.මාගේ පියා දැන් දැඩි අසනීප තත්වයේ පසුවන අතර, ඔහුගේ ජීවිත කාලය දින කිහිපයක් බවට වෛද්‍ය නිලධාරීන් නිශ්වය කර ඇත.මේ අවස්ථාවේදී මා හට හැකි විගස ශ්‍රී ලංකාවට යාමට හැක්කේ කෙසේද?</u>**

1. **<u>මාගේ වීසා වැඩකටයුතු සම්බන්ධයෙන් උපකාරක ලිපි ලේඛන ගණනාවක් ඉදිරිපත් කල යුතුව ඇත.මා ඉදිරිපත් කරන එක් ලේඛනයක විස්වාසවන්ත භාවය පිළිබඳව මා හටම ගැටළුවක් පවතී. ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවට මෙම ප්‍රශ්නගත ලේඛනය ඉදිරිපත් කල හැක්කේ කෙසේද ?</u>**

   නම් සඳහම් නොකරන පුද්ගලයෙක්.

   ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන සහ අදාල අනෙකුත් නීති රීතීන් ඉතා දැඩි වේ. ඔබ යම් අවිශ්වාස කටයුතු ලේඛනයක් ඉදිරිපත් කරන්නේ නම්, එහි වගකීම ඔබ සතු වෙයි.සැක කටයුතු ලේඛනවල විශ්වාසවන්තභාවය මැන බැලීම සඳහා වෙනම කාර්යාල අංශයක්ද ඕස්ට්‍රේලියාව සතුය.එබැවින් සත්‍ය සහ විශ්වාසවන්ත ලේඛන පමණක් ඉදිරිපත් කිරීමට වග බලා ගන්න.

2. **<u>මාගේ වීසාව අයදුම් කර දැන් එය සැකසෙන අවස්ථාවේ (Processing period) පවතීයි.මා හට තාවකාලික A වීසාවක් ( Bridging visa A ) ලැබී තිබේ.මාගේ පියා දැන් දැඩි අසනීප තත්වයේ පසුවන අතර, ඔහුගේ ජීවිත කාලය දින කිහිපයක් බවට වෛද්‍ය නිලධාරීන් නිශ්වය කර ඇත.මේ අවස්ථාවේදී මා හට හැකි විගස ශ්‍රී ලංකාවට යාමට හැක්කේ කෙසේද?</u>**

   Nuwan – Adelaide

   ඔබට තාවකාලික B වීසාව (Bridging Visa B) අයදුම් කර ගමන් පහසුව සළසා ගත හැකිය.නමුත් මෙයට සැකසෙන කාලයක් ගත වන බැවින් වඩා සුදුසු වන්නේ අදාල අයදුම් පත්‍රය ඉදිරිපත් කර/ඉදිරිපත් කිරීමට වෙලාවක් මුලින් වෙන් කරගෙන Department of Home Affairs කාර්යාලය වෙත යාමයි.

3. **<u>දේපළ මිළට ගැනීමට ගිවිසුම් අත්සන් කළ ගැනුම්කරු, ඔහුගේ ණය පහසුකම තවම බැංකුවෙන් ලබා දී නොමැති බැවින් එම ගිවිසුමෙන් ඉවත් වීමට ඉල්ලා සිටී.ඔහුට එය කල හැකිද?</u>**

   Priyantha- Sunshine

   මේ සඳහා සලකා බැලිය යුතු කරුණු කිහිපයකි.
   1. ගිවිසුමේ ණය පහසුකම් සඳහා විශේෂ කොන්දේසි (Special Conditions) තිබේද?
   2. එසේ ණය පහසුකම ලබා ගැනීමේ කාලසීමාව තුල ගැනුම්කරු සිටීද හෝ ඔහු ඒ සඳහා කාල දිගුවක් ( Extension ) ඉල්ලා තිබේද?
   මේ කරුණු අතරතුර ඔහුට ණය පහසුකම තවදුරටත් ලබා ගැනීමට අවස්ථාව නොමැති නම්, සහ ඔහුට මෙම ගිවිසුමෙන් ඉවත් වීමට අවශ්‍ය නම් ඔහු ඔබ වෙත ණය ප්‍රතික්ෂේපිත ලිපියක් (Finance Decline Letter) පිළිගත් මූල්‍ය ආයතනයකින් ඉදිරිපත් කළ යුතුය.එසේ වන්නේ නම් පමණක්, ඔහුට ගිවිසුමෙන් බැහැර වීමට අවස්ථාව ලැබෙන අතර, නැතහොත් ඔහුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඔබට හැකියාව ලැබෙනු ඇත.

4. **<u>අසල්වැසි නිවසේ පදිංචි ස්ත්‍රිය මා හට නිතර කරදර ඇති කරන අතර දැන් නවතම කරදරය වන්නේ ඇගේ නිවසේ වැකුම් යන්ත්‍රය ඉතා ඝෝෂාකාරීව ක්‍රියාත්මක කිරීමයි. මෙය මා හට ඉතා පීඩාකාරී වන අතර, නිහඬ වටාපිටාවෙන් යුතු නිවසක ජීවත් වීමට කැමති මා හට මෙය ඉතා ගැටළුකාරී තත්වයක් මතුකර ඇත.මෙයට විසඳුමක් ලබාගන්නේ කෙසේද?</u>**

   Grace – Berwick

   ඔබට මෙම ඝෝෂාකාරී වටාපිටාව අසල්වැසියා විසින් හිතාමතා ඇතිකරන්නේ නම්, අදාල පළාත් පාලන ආයතනයට ( Council ) ඒ බව දන්වන්න. නැතහොත් Neighbourhood Dispute Resolution Center වෙත දන්වන්න.

